ලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය**

மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்

Western Provincial Education Department – Colombo Ed

**දෙවන වාර ඇගයීම - 2016**

இரண்டாம் தவணை மதிப்பீடு - 2016

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය<br>தரம் 7 | නාට්‍ය හා රංග කලාව 1 පත්‍රය<br>கணிதம் வினாத்தாள்-1 | පැය දෙකයි<br>ஒரு மணித்தியாலம் |

**01 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**1-5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු පහත සඳහන් අක්ෂර ඇසුරෙන් සපයන්න.**

A. කුකුළු හාමි අර එන්නේ
වී ටික කොටලා එන්නේ
හංගපල්ල බෝලෙ පිත්තු
හංගපල්ල බෝලෙ පිත්ත

B. රංග භූමි/ඇහැට කනට/ ආයුබෝවන්

C. කැමට අත දමමින් නොමගන්නේ
කනවිට කැත ලෙස තලු නොගසන්නේ

D. අහසින් අවුත් මිණිඅක් නයිඳු යැදුමට
රහතන් මැදෙහි මුනි හිඳ මිණි පළඟ පිට

01. "A" අක්ෂරයෙන් දැක්වෙන්නේ
i. වේදිකා නාට්‍යයකි ii. චිත්‍රපටයකි
iii. ටෙලි නාට්‍යයකි iv. උපදේශාත්මක කාව්‍යයකි

02. රූපවාහිනී වැඩ සටහන් ඇතුළත් අක්ෂරය නම්,
i. A ය ii. B ය iii. C ය iv. D ය

03. සිරිත් මල් දමෙන් උපුටාගත් කවිය අඩංගු අක්ෂරය,
i. A ය ii. B ය iii. C ය iv. D ය

04. ඉතිහාසය පිළිබඳව සඳහන් වන අක්ෂරය වන්නේ,
i. A ය ii. B ය iii. C ය iv. D ය

05. මෙහි දක්වා ඇති අක්ෂර අතුරෙන් සෝමලතා සුබසිංහ මහත්මිය නිෂ්පාදනය කළ ළමා වේදිකා නාට්‍ය අඩංගු අක්ෂරය,
i. A ය ii. B ය iii. C ය iv. D ය

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය සමඟ ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. "ඉතිහාසයේ සිදුවූ වැදගත් සිදුවීම් විවිධ මූලාශ්‍ර ඔස්සේ අපට දැනගත හැකිවේ. එකී සිදුවීම් ඇතුළත් චරිත අපට ප්‍රතිනිර්මාණය කළ හැකිය."

ඉහත ප්‍රකාශය ඇසුරු කරමින් පිළිතුරු සපයන්න.

i. ඉතිහාසයේ තොරතුරු දැනගත හැකි මූලාශ්‍ර 2 ක් නම් කරන්න. (ලකුණු 02)
ii. ඉතිහාස තොරතුරු රැගත් චිත්‍රපට 02 ක් ලියන්න. (ලකුණු 02)
iii. ඉතිහාසගත විරුවන්ගෙන් ඔබට ලැබෙන ජීවිතාදර්ශ 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)
iv. ඉතිහාසගත වීර චරිතයක් ඔබට ප්‍රති නිර්මාණය කිරීමට සිදු වුවහොත්. ඔබ එම චරිතය නිරූපණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)
v. ගජබා රජු චෝල දේශයට ගිය අවස්ථාවේ සොලී රජතුමා ඉදිරියේදී එතුමා කළ ප්‍රකාශයක් සංවාදයක් ආකාරයට ලියන්න. (වාක්‍ය 4 ක් පමණ) (ලකුණු 02)

(මුළු ලකුණු 10)

02. i. රංග අභ්‍යාස කිරීමෙන් නළුවකුට අත්වන ප්‍රයෝජන 2 ක් ලියන්න. (ලකුණු 04)
ii. කටහඬ අභ්‍යාස 02 ක් නම් කරන්න. (ලකුණු 02)
iii. ශිථිලකරණ අභ්‍යාස තුළින් නළුවාගේ රූපණ ක්‍රියාවලියට ලැබෙන දායකත්වය කුමක්ද ? (ලකුණු 02)

iv. පරිකල්පන අභ්‍යාසයක් නම් කර, එම අභ්‍යාස සිදු කරන ආකාරය පියවරෙන් පියවර විස්තර කරන්න. (ලකුණු 04)

03. i. රංගාභරණ හෝ රංග භාණ්ඩ රූපණ ක්‍රියාවලියේදී නළුවාට වැදගත් වන්නේ ඇයි ? (ලකුණු 02)
ii. රංගාභරණ නිර්මාණයේදී සැලකිලිමත් වියයුතු කරුණු 4 ක් ලියන්න. (ලකුණු 02)
iii. ඔබ පන්ති කාමරයේදී නිර්මාණය කළ රංගාභරණ නිර්මාණය කළ ආකාරය පියවරෙන් පියවර විස්තර කරන්න. (යොදාගත් අමුද්‍රව්‍ය පිළිබඳව ද සඳහන් කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

04. ඔබ දන්නා ඓතිහාසික කතාවකින් නාට්‍ය පෙළක් රචනා කරන්න.
i. නාට්‍යෝචිත අවස්ථා සඳහා (ල.04)
ii. රංග විධාන (ල.02)
iii. චරිත නිරූපණය (ල.04)

(මුළු ලකුණු 10)

05. i. පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයේ වේදිකාවට උචිත ලෙස කුකුළුහාමිගේ නිවස චිත්‍රගත කරන්න.

(මුළු ලකුණු 05)

ii. කුකුළුහාමිගේ හෝ මීයෙකුගේ රංග වස්ත්‍රයක් චිත්‍රගත කරන්න. (ලකුණු 05)

**6-10 දක්වා අදාළ ප්‍රශ්නවලට පිළිතුරු ආ කොටසින් තෝරා යා කරන්න.**

| අ | | ආ |
|---|---|---|
| 06. | වෙද පුටුව | ශිථිලකරණයයි |
| 07. | රබන් පදකිම | වේෂ භූෂණ |
| 08. | යොදාගන්නා ඇඳුම් සහ පළඳින ආභරණ | චරිත අධ්‍යයනය කිරීම වැදගත් වේ. |
| 09. | රූපණය සාර්ථකව සිදු කිරීමට | කටහඬ අභ්‍යාසයයි. |
| 10. | ශරීරය සැහැල්ලු කිරීම | පරිකල්පන අභ්‍යාසයකි |

**11-15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර ඉදිරියෙන් හරි නම් √ ලකුණද, වැරදි නම් × ලකුණ ද යොදන්න.**

11. රූපවාහිනී නාට්‍යයකින් නැරඹිය හැක්කේ කැමරාකරුගේ දෘෂ්ටි කෝණ මගින් යොමු කරවන දර්ශන පමණකි. (......................)

12. සාමූහිකව කතන්දර ගෙතීමේදී ඒකාබන්ධතාව බිඳීමෙන් කතාවේ රසයට හානියක් නොවේ. (......................)

13. නාට්‍යයක කතා වස්තුව රැගෙන එන්නේ එහි ඇතුළත් චරිත විසිනි. (......................)

14. වාචික අභිනය පැමට විවිධ උච්චාරණ ශෛලීන් පුහුණුවීම අවශ්‍ය නොවේ. (......................)

15. නළුවකුගේ හැඟීම් ප්‍රකාශනය සඳහා කටහඬ අත්‍යවශ්‍ය නොවේ. (......................)

**16- 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැනට යොදන්න.**

**(සංස්කරණ ක්‍රියාවලියකින්/පූර්ණ නාට්‍යමය රසය/ ස්වාමි සහ යහළුවෝ/කම් පොත/චරිත ස්වභාවය හා ගුණාංග)**

16. වේදිකා නාට්‍යයක් සජීවීව නැරඹීමෙන් ............................................ උකහා ගත හැකිය.

17. රූපවාහිනී නාට්‍යයක් ප්‍රේක්ෂකයා හමුවට පැමිණෙනුයේ ......................................................පසුවය.

18. වාචික අභිනය .............................................. කියවීම තුළින් වර්ධනය කරගත හැකිය.

19. ඓතිහාසික කතා තුළ ඇති චරිත ප්‍රතිනිර්මාණය කිරීමේදී .................................... හඳුනාගත යුතුය.

20. විදේශීය ළමා ටෙලි නාට්‍යයක් ලෙසට ................................................ ගත හැකිය.

(ලකුණු 1 × 20)